# අනුකාරකයන්ට ද වැදගත්කමක් වෙයි

මිනිසා භාෂා නිර්මිතියක් ය යනුවෙන් කියැවෙන පශ්චාත්නූතනවාදී කසිකබල් මතය වේවා එහි තරමක් සාධාරණීකරණයෙන් නිර්මාණය කරගත හැකි මිනිසා සංස්කෘතික නිර්මිතියක් ය යන්න වේවා ඒකරේඛීය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් ගලා එන්නකි. මෙහි මිනිසා යන්නෙන් වියුක්ත මිනිසා හැඳින්වෙන බව ද එහෙත් භාෂා යනුවෙන් වියුක්ත භාෂාවක් නොව ඒ ඒ භාෂා හැඳින්වෙන බව ද අමතක නොකළ යුතු ය. එබැවින් ම ඒ සූත්‍රගත කිරීමෙහි තරමක පරස්පරයක් ද වෙයි. වියුක්ත මිනිසා සංයුක්ත භාෂාවක නිර්මිතයක් ලෙස සලකණු ලැබීම පරස්පරයකි. කෙසේවෙතත් ඒ පරස්පරයෙන් ගැලවෙන මගක් වෙයි. ඒ මිනිසා යනු වියුක්ත මිනිසා ලෙස නොව ඒ ඒ භාෂා කතාකරන මිනිසුන් ලෙස සැලකීමෙන් ය. ඒ පරස්පරයෙන් එසේ ගැලවුණ ද පශ්චාත්නූතනවාදී බංකොලොත් බුද්ධිමතුනට (මා සඳහන් කරන්නේ මෙරට සිටින අනුකාරක ඇංකරයන් ගැන නොවේ. ඔවුහු බංකොලොත් වුව ද, බුද්ධිමත්තු නොවෙති. සාහිත්‍ය විචාරය ගැන කුන්දේරා මහතා හෝ වෙනත් අයකු හෝ කියන දේත් දර්ශනය ගැන ඩෙරීඩා මහතා හෝ වෙනත් අයකු හෝ කියන දේත් තම තමන්ට වැටහෙන අයුරින් සිංහලෙන් කීම මොන බුද්ධිමත් වැඩක් ද?) ඒක රේඛීය චින්තනයට උරුම වූ පරස්පරවලින් මිතිය හැකි නොවේ. ඒ ඒ මිනිසුන් භාෂාවලින් හෝ සංස්කෘතීන්ගෙන් නිර්මිත නම් භාෂා හා සංස්කෘතීන් නිර්මාණය කරන්නේ කවු ද?

බටහිර පරිණාමවාදය, එනම් ඩාවිනීය පරිණාමවාදය හා සමාජ පරිණාමය පිළිගත්ත ද, භාෂා ඇති වීමට පෙර සංස්කෘති ඇති වූ බව ද, සංස්කෘති ඇති වීමට පෙර මිනිසුන් ජීවත් වූ බව ද පිළිගැනීමට සිදු වෙයි. එවිට සංස්කෘතීන් ද භාෂා ද නිර්මාණය කරන්නට ඇත්තේ මිනිසුන් බව පිළිගැනීමට සිදු වෙයි. මිනිසුන් ඒ ඒ සංස්කෘතීන් ඇති කිරීමේ දී එක් සාධකයක් පමණක් එයට බල පෑවේ යැයි ගැනීම වරදකි. එසේ ගැනීම බටහිර විද්‍යාවට අනුව වරදක් නොවන නමුදු සියල්ල එකකට ඌනනය නොකරන අපේ චින්තනය තුළ වරදක් වෙයි. බටහිර විද්‍යාවට පදනම් වූ චින්තනය මත එසේ ගැණුන ද, ඒ හරහා කලින් සඳහන් කළ අන්දමේ පරස්පරවලට මුහුණ දීමට සිදුවෙයි. එබැවින් අප විසින් අපේ ප්‍රවාද නිර්මාණයේ දී කළ යුත්තේ සංස්කෘතීන් ඇති කිරීමේ දී විවිධ සාධක බලපාන්නට ඇති බවත්, සංස්කෘතීන් ඇති කිරීමෙන් පසුව ඒවා ඒ ඒ මිනිසුන් කෙරෙහි විවිධාකාරයෙන් බලපාන්නට ඇති බවත් නිගමනය කිරීම ය.

කලින් සඳහන් කර ඇති ආකාරයට සංස්කෘතීන් පවතින්නේ සන්නිවේදනය හේතුවෙනි. සන්නිවේදනයක් නැතිව සංස්කෘතියක් පවත්වාගෙන යා හැකි නොවේ. එහෙත් සන්නිවේදනයට භාෂාවක් අවශ්‍ය ම නොවේ. කෙසේවෙතත් සංස්කෘතියක් ඇති කිරීමේ දී බලපාන්නට ඇති සාධක අතර අදාළ මිනිසුන් කොටස පවත්වාගෙන යෑම ද ප්‍රධාන කාර්යයක් ඉටුකරන්නට ඇතැයි සිතිය හැකි ය. මිනිසුන් ජාන ආශ්‍රයෙන් ජෛවීය ව උරුම කරගන්නා දේට අමතර ව පැවැත්ම සඳහා වෙනත් යමක් ආධාර වන්නේ නම් එය ඊළඟ පරම්පරාවට සන්නිවේදනය කිරීම වැඩදායක වෙයි. මෙහි දී තවත් දෙයක් කිවයුතු වෙයි. එය අනුකාරකයන්ගේ චිත්ත ප්‍රීතියට හේතු වනු නොඅනුමාන ය. මිනිසුන් මුලින්ම සන්නිවේදනය කිරීමේ දී අනුකරණය ද යොදා ගත්තාට සැකයක් නැත. ඇතැම් විට අනුකරණය මිනිසුන්ගේ පළමු සන්නිවේදන මාධ්‍යය වන්නට ද ඇත. එය එසේ වුවත් අනුකාරකයන් කරන්නාක් මෙන් අප සැමදාමත් අනුකරණය කළ යුතු යැයි ඉන් නොකියැවෙයි.

ළදරුවන්ට ජෛවීය ව හා සංසාරික ව උරුම වන දේ හැරෙන්නට ඔවුන් වෙනත් දෑ හුරු කර ගන්නේ, එනම් උරුම කර ගන්නේ අනුකරණයෙනි. අනුකරණය කිසිවකු විසින්වත් ළදරුවන්ට කියා දෙනු ලබන දෙයක් නොවේ. ඇතැම් විට අනුකරණය නොමැති වී නම්, එනම් මිනිසුන්ට අනුකරණය කිරීමේ හැකියාව නොවී නම්, සංස්කෘතීන් බිහි නොවීමට ද ඉඩ තිබුණි. සංස්කෘතීන් ඇති සියළු සත්ත්ව වර්ගයනට අනුකරණය කිරීමේ හැකියාව තිබිය යුතුය යන්න එහි දී උපකල්පනය කෙරෙයි. එය එසේ නම් අනුකරණයෙන් ද, අනුකාරකයන්ගෙන් ද යම් සේවයක් ඉටු වී ඇත. අපට මේ කරුණ පහත සඳහන් අයුරින් සූත්‍රගත කරගත හැකි ය. චොම්ස්කි විද්වතාණන්ට අනුව මිනිසුන්ට භාෂා ඉගෙන ගැනීමේ හැකියාව උපතින් ම, එනම් ජෛවීයව ම හිමි වී ඇත. මිනිස් මොළය සකස් වී ඇත්තේ පාර ව්‍යාකරණයක් (metagrammar) සඳහා ද අවකාශය ලබා දෙමිනි. මේ පාර ව්‍යාකරණය හේතුවෙන් වාක්‍ය කිහිපයක් පමණක් ඉගෙනීමෙන් පසුව ළදරුවකුට තමන් දන්නා වචන ඇසුරෙන් වාක්‍ය අති විශාල ප්‍රමාණයක් (අනන්තයට එළෙඹෙන

© Prof. Nalin De Silva

ප්‍රමාණයක්) නිර්මාණය කිරීමේ හැකියාව ලැබෙයි. එපරිද්දෙන් ම මිනිස් මනසේ ගුණයක් වනුයේ අනුකරණයයි. මිනිස් මනසට (මොළයට) ජෛවීය ව අනුකරණය කිරීමේ හැකියාව ලැබී ඇත. ජෛවීයව එසේ නොලබන්නට අනුකරණය කියා දිය යුතු ව ඇත. එනම් සන්නිවේදනය කළ යුතු ව ඇත. එහෙත් අනුකරණයක් නැතිව එසේ සන්නිවේදනය කරන්නේ කෙසේ ද? මෙයින් කියැවෙන්නේ අනුකරණයෙහි ඇති වැදගත්කම ය. ළදරුවන් ජෛවීය ව උරුම කර නොගන්නා දේ, සන්නිවේදනයෙන් ඉගෙනීමට පළමුව, මුලින් ම ලබා ගන්නේ අනුකරණයෙනි. වචන ශබ්ද කිරීම පවා මුලින් ම ඉගෙන ගන්නේ අනුකරණයෙනි. භාෂා නිර්මාණය කර ගැනීමට පෙර මිනිසුන් ඉඟියෙන් යමක් සන්නිවේදනය කෙළේ නම් එහි දී ද අනුකරණය වැදගත් වූවාට සැකයක් නැත. අනුකරණය ප්‍රාථමික අවධියේ දී වැදගත් වෙයි. අනුකාරකයෝ හැමදාමත් හැම කරුණක් සම්බන්ධයෙන් ප්‍රාථමික අවධියක පසුවෙති. කෙසේවෙතත් අනුකරණය සම්බන්ධයෙන් මෙහි කියා ඇති දේ පර්යේෂණ හා වෙනත් ක්‍රම ඇසුරෙන් තවත් අධ්‍යයනය කළ යුතු වෙයි.

සංස්කෘතියක් ඇති වීමෙන් පසුව නිරන්තරයෙන් ම තව තවත් දෑ එයට එකතු වෙයි. ඒ ඒ සංස්කෘතීන් ගැන කෙරෙන විස්තරාත්මක අධ්‍යයනයකින් ඒ සංස්කෘතීන් විකාශය වී ඇති ආකාරය ද, විකාශයෙහි දී බල පා ඇති සාධක කවරේදැයි ද, යම් තරමකට හෝ දැන ගත හැකි ය. සංස්කෘතීන් ඇති වීමේ දී හා වර්ධනය වීමේ දී ඒ ඒ මිනිසුන් ජීවත්වන භූගෝලීය ප්‍රදේශ යම් ආකාරයකට එයට බලපානවා විය හැකි ය. එහෙත් මහාචාර්ය මීගස්කුඹුර මහතා විසින් පරිවර්තිත මහාචාර්ය නකමුරා මහතාගේ පෙරදිග මිනිසුන්ගේ චින්තන විධි නම් කෘතියෙහි ද සඳහන් ආකාරයට සංස්කෘතියට බලපාන එක ම සාධකය ඒ ඒ මිනිසුන්ගේ ජීවිතයට බලපාන භූගෝලීය (භෞතික) සාධකය පමණක් නොවේ. ඇතැම් මිනිසුන් අතර පරලොවක් ගැන විශ්වාසයක් ඇති වීමටත් තවත් මිනිසුන් අතර තවත් එක් වරක් පමණක් ස්වර්ගයේ හෝ අපායේ හෝ ඉපදීම පිළිබඳ විශ්වාසයක් ඇති වීමටත් හේතුව කුමක් ද? මේවා විශ්වාස පමණක් ද? පුනරුත්පත්තිය පිළිබඳ ප්‍රවාදයට තුඩු දෙන වෙනත් සාධක වේ ද? ධ්‍යාන වැඩූ භාරතීයනට සත්ත්වයන් නැවත නැවත භවයෙන් භවයට සංසාරයේ ගමන් කරන බව වැටහුණි ද? භාරතීයන් ධ්‍යාන වැඩීමට යොමු වූයේ ඇයි? ඔවුහු ධ්‍යාන වැඩීමටත් පෙර පුනරුත්පත්තිය ගැන දැන සිටියෝ ද? චීන ජාතිකයන් කුන්ෆියුෂියස් ධර්මය වෙත ඇදී ගියේ කෙසේ ද? එය පැරණි චීන රාජාණ්ඩුක්‍රමය හා සමාජය සාධාරණයකිරීම සඳහා යොදා ගත් ධර්මයක් ද? නැතහොත් ඒ ධර්මය පැරණි චීන සමාජය ඇති කිරීමෙහි ලා ඉවහල් විණි ද? ටාඕ දහම චීන ජාතිකයන්ට ස්වභාව ධර්මය සමග එකට සහජීවනයෙන් විසීමට මාර්ගය කියා දුන්නේ ද? චීන ජාතිකයන් සංයුක්තයට බර වූ අතර භාරතීයන් අතර වියුක්තිය ද යම් ප්‍රමාණයකට ඇති වූයේ කෙසේ ද? භාරතීයනට වියුක්තිය හා න්‍යාය ලැබුණේ බටහිරින් පැමිණි ආර්යයන්ගෙන් ද? ආර්යයන් භාරතයට සංක්‍රමණය වීමට පෙර යුදෙව්වන්ගෙන් බටහිර ආසියාවේ දී වියුක්තිය ඉගෙන ගන්නට ඇත් ද? නැතහොත් ආර්යයන් පැමිණීමට පෙර සිට ම භාරතීයයන්ට වියුක්තිය පිළිබඳ යම් දැනුමක් වී ද? ග්‍රීකයන්ට ස්ව සිද්ධි මූලක ක්‍රමය ලැබුණේ කෙසේ ද? ඔවුන්ට එහි මූලිකාංග යුදෙව්වන්ගෙන් ලැබී පසුව ඔවුන් විසින් එය ඉතා ඉහළ මට්ටමකට වර්ධනය කෙරිණි ද? මේ සියල්ලෙහි දී චින්තනය කෙසේ බලපෑවේ ද?

ඉහත දක්වන ලද්දේ කිහිප දෙනකුට තම ජීවිත කාල පුරා ම අධ්‍යයන කළ හැකි ප්‍රශ්න කිහිපයකි. සංස්කෘතිය, චින්තනය, එහි විකාශය ආදිය සම්බන්ධයෙන් කෙරී ඇති අධ්‍යයන ඉතා අල්ප ය. අපේ විද්‍යාඥයන්ට බටහිරයන් පසු පස නොගොස් ප්‍රවාද නිර්මාණය කිරීමෙහි ලා මේ ක්ෂෙත්‍රය උපයෝගී කර ගත හැකි ය. මෙහි දී අවධානය යොමු විය යුතු කරුණක් නම් එක් සංස්කෘතියකින් තවත් සංස්කෘතියකට යම් ගුණ අවශෝෂණය කිරීමේ දී සිදුවන ක්‍රියාවලිය ය. ලෝකයේ අනාදිමත් කාලයක සිට සංස්කෘතීන් වෙනත් සංස්කෘතීන් මුණ ගැසී ඇති බැවින් මේ පිළිබඳ අධ්‍යයනවලට අවශ්‍ය ප්‍රමාණයට කරුණු ඇතැයි කිව හැකි ය. ආර්යයන් පළමුවෙන් භාරතයට පැමිණිවිට සිදු වූයේ කුමක් ද? ආර්යයන් පැමිණීමට පෙර භාරතයේ හා ලංකාවේ තිබූ සංස්කෘතීන් කෙතරම් දුරට චීන, තිබ්බත, මොංගෝලියානු ආදී සංස්කෘතීන් සමග සමාන කමක් ඉසුළුවේ ද? විශේෂයෙන් ම චින්තනයෙන් ඒ ඒ ජනවර්ග හා ජාතීන් අතර තිබූ සමානකම් කවරේ ද? ආර්යයන් යම් අයුරකින් චීනයට ද ගියේ නම් කුමක් සිදු වීමට තිබුණි ද?

ආර්ය සංස්කෘතිය හා භාරතයේ ප්‍රාග් ආර්ය සංස්කෘතිය එකතු වී වෛදික සංස්කෘතිය ඇති වූ බවට සැකයක් තිබිය හැකි නොවේ. (ප්‍රාග් ආර්ය යනු ද්‍රවිඩ නොවන බව අවධාරණය කළ යුතු ය. ද්‍රවිඩයන් භාරතයට පැමිණ ඇත්තේ ආර්යයන් පැමිණීමෙන් බොහෝ කලකට පසුව ය.) එහි දී වෙනත් ම චින්තනයක් ද බිහි වී ඇති බව පැහැදිලි ය. මේ වෛදික චින්තනය විසින් භාරතයට න්‍යාය, වියුක්තය ආදිය හඳුන්වා දෙනු ලැබිණි යැයි අපට දැනට උපකල්පනය කළ

© Prof. Nalin De Silva

හැකි ය. කලින් ද සඳහන් කර ඇති පරිදි සිද්ධාර්ථ කුමරු ඉපදුණේ වත්මන් නේපාලය යනුවෙන් හඳුන්වන වෛදික චින්තනයට එතරම් ගොඩුරු නොවූ ප්‍රදේශයක ය. එතුමන්ගේ ලෞකික විප්ලවය, අප එය එසේ හඳුන්වන්නේ නම්, වෛදික චින්තනයට ද විරුද්ධ ව විය. එහෙත් බෞද්ධ චින්තනයට භාරතය ජය භූමියක් නොවිණි. බුදු දහම රැකුණේ ලංකාවේ හා චීන මොංගෝලියානු තිබ්බත සංස්කෘතීන්වල ය. ද්‍රවිඩයන් දකුණු භාරතයට සංක්‍රමණය වීමෙන් පසුව එහි ගොඩ නගන ලද ද්‍රවිඩ සංස්කෘතියෙහි ද බුදු දහම නොරැකුණු බව සටහන් කර ගත යුතු ය. ද්‍රවිඩ දකුණෙහි (ද්‍රවිඩ යන්නෙහි තේරුම ම දකුණ වෙයි!) නාගර්ජුනපාදයන් වැනි අති දක්‍ෂයන් බිහි විණි ද උන්වහන්සේලා අතින් සිදු වූ වර්ධනයන් ද අවසානයේ දී වෛදික හින්දු සංස්කෘතියට යට විය. වෛදික චින්තනයට එරෙහි ව දකුණු භාරතයෙහි යමක් ගොඩ නැගුනේ ද, එසේ ගොඩ නගන ලද දෑ අවසානයේ දී වෛදික චින්තනය හා සංස්කෘතිය විසින් ම ගිල ගනු ලැබුයේ ද, කෙසේ ද?

බුදු දහම රැකුණේ හුදෙක් රාජ්‍ය අනුග්‍රහ ආදිය ලැබීම නිසා යැයි කියා හෝ බුදු දහමේ පැවැත්මට සිටු (වෙළෙඳ) කුලයක් අවශ්‍ය යැයි කියා හෝ ඊනියා ආර්ථික හේතු දීමෙන් ඉහත සඳහන් දෑ තේරුම් ගත නොහැකි ය. සංස්කෘතිය ද ඇතුළු ඊනියා උඩුමහලේ වන ක්‍රියාකාරකම් ඊනියා ආර්ථික අධොව්‍යුහයට (infrastructure) ඌනනය කිරීම කසිකබල් මාක්ස්වාදී විධික්‍රමය වෙයි. එ බටහිර චින්තනය මත පදනම් වෙයි. අපට ඒ කරුණු වෙනත් ක්‍රමයකට තේරුම් ගත හැකි ය. ඒ චින්තන හා සංස්කෘති ආශ්‍රයෙනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva